විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

விஞ்ஞான, தொழில்நுட்பவியல் மற்றும் ஆராய்ச்சி அமைச்சு

Ministry of Science, Technology and Research




2016

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

Annual Performance Report

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2016

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 රාජ්‍ය

මුදල් චක්‍රලේඛයේ සඳහන් උපදෙස් පරිදි

සම්පාදනය කරන ලදි.

පටුන

		පිටු අංකය
1.	**හැඳින්වීම**	**1**
1.1	අමාත්‍යාංශයේ අරමුණු සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක	3
2.	**සංවිධානාත්මක සැකැස්ම**	**4**
2.1	පරිපාලන සහ මුදල් අංශය	4
2.2	තාක්ෂණ පැවරුම් අංශය	4
2.3	ජාත්‍යන්තර සබඳතා අංශය	4
2.4	විද්‍යා හා පර්යේෂණ සංවර්ධන අංශය	4
2.5	සැලසුම් අංශය	4
2.6	අභ්‍යන්තර විගණන අංශය	4
2.7	ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය	4
2.8	විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය (COSTI)	5
3.	**2016 වර්ෂය තුළ අමාත්‍යාංශයේ කාර්යසාධනය**	**5**
3.1	පරිපාලන සහ මුදල් අංශය	5
3.2	විද්‍යාත වැඩසටහනෙහි ප්‍රගතිය	5
3.3	තාක්ෂණ සහ පර්යේෂණ සංවර්ධනය	9
3.4	ග්‍රහලෝකාගාරය	13
3.5	ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය (SLINTEC)	14
3.6	2016 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම	16
3.7	විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම	17
4.	**2016 වසරේ මූල්‍යමය ජයග්‍රහණ**	**17**
4.1	අමාත්‍යාංශයේ සහ ආයතනයන්හි මූල්‍යමය ජයග්‍රහණයන්හි සාරාංශය	17
4.2	අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම්	18
4.3	ආයතනයන්හි පුනරාවර්තන වියදම්	19
4.4	අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම්	19
4.5	අත්තිකාරම් ගිණුම්	21

පෙර දැක්ම

2020 වර්ෂයේදි විද්‍යාව හා තාක්ෂණයෙන් උසස් රටක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම

මෙහෙවර

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනයට අත්‍යවශ්‍ය වූ නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම හා ආර්ථික ක්‍රියාදාමයන් පුළුල් කිරීම සඳහා, විද්‍යාත්මක පර්යේෂණ සංවර්ධනය සහ තාක්ෂණ පැවරුම් ඇතුළත්ව විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමට සහ ප්‍රචලිත කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම

1. හැඳින්වීම

ලොව පුරා ක්‍රියාත්මක උසස් කාර්මික ආර්ථිකයන් විසින් තිරසර ආර්ථික වර්ධනයක් සහතික කරනු පිණිස, උසස් තාක්ෂණයන් කරා ක්‍රමයෙන් නැඹුරු වෙමින් සිටී. රටක සංවර්ධනය සඳහා මෙන්ම නිෂ්පාදන හා සේවා අංශයන්හිදී ගෝලීය වෙළඳපළ හා තරග වැදීම උදෙසා වැදගත් දායකත්වයක් ලබාදෙන්නක් ලෙස තාක්ෂණික නවෝත්පාදනයන් හඳුනාගනු ලැබ ඇත. නව තාක්ෂණයන් හරහා අමුද්‍රව්‍ය මත පදනම් වූ අපනයනයන් සඳහා අගයන් එක්කෙරේ. එබැවින්, ගෝලීය වෙළඳපළ හා තරග කිරීම සඳහා පමණක් නොව, රටෙහි ජාතික සංවර්ධන අභිමතාර්ථයන් ළඟා කරගනු පිණිසද, ආර්ථිකයේ අදාළ අංශයන් වෙත තාක්ෂණ හා නවෝත්පාදන මුහු කිරීම ඉතා වැදගත් වන්නකි.

ඒ අනුව, ජාතික සංවර්ධන අභිමතාර්ථයන් සපුරා ගැනීමේ ක්‍රියාවලියේදී, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය වෙත සුවිශේෂී කාර්යභාරයක් පැවරී ඇති අතර එහිදී ඉල්ලුම මත පදනම් වූ පර්යේෂණයන්හි නියැළීම, පර්යේෂණ වාණිජකරණය, නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රවර්ධනය, ප්‍රමිතීන් සහ සහතිකකරණයන් සඳහා පහසුකම් සැපයීම යනාදිය සඳහා රාජ්‍ය පර්යේෂණ ආයතනයන් යොමු කිරීම අපේක්ෂා කෙරේ. මෙම කාර්යය ඉටුකිරීම සඳහා, අමාත්‍යාංශය විසින් පර්යේෂණ, පර්යේෂණ අරමුදල් සපයාදීම සහ සංවර්ධන ප්‍රමුඛතාවන් අතර සබඳතාවන් ස්ථාපනය කිරීම සඳහා ඉහළම ප්‍රමුඛතාව ලබාදීම සඳහා අඛණ්ඩව පියවර ගනු ලැබිණි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (1) (අ) වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමන් විසින් සිදුකරනු ලැබූ විෂයයන් හා කාර්යයන් පැවරීම හා අනුකූලව 2015 සැප්තැම්බර් 21 දිනැති අංක 1933/13 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ පහත සඳහන් විෂයයන්, කාර්යයන් සහ ආයතනයන්, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරයා වෙත පැවරේ.

- විද්‍යාව, තාක්ෂණය සහ පර්යේෂණ යන විෂයයන්ට අදාළව සහ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා යනාදිය යටතට ගැනෙන විෂයයන් හා අදාළව ප්‍රතිපත්තීන්, වැඩසටහන් සහ ව්‍යාපෘතීන් සම්පාදනය, ඒවා සුපරීක්ෂණය සහ ඇගැයීමට ලක්කිරීම.
- ජාත්‍යන්තර වශයෙන් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයෙහි සිදුකරනු ලැබූ පර්යේෂණයන් ඇසුරෙන් ලත් නව සොයාගැනීම් සහ පර්යේෂණ සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයාදීම
- විද්‍යාත්මක, කාර්මික සහ සංවර්ධන ක්‍රියාකාරකම් පුළුල් කිරීම සඳහා පියවර ගැනීම
- පර්යේෂණ සැලසුම් කිරීම සහ සිදුකිරීම සඳහා පර්යේෂණ සහ පර්යේෂණ ආයතන වෙත පහසුකම් සලසාදීම
- නිනිති සහ ජෛව තාක්ෂණය ඇතුළත්ව, නව පර්යේෂණ සහ සොයාගැනීම් පිළිබඳ තොරතුරු, ව්‍යාපාරික ප්‍රජාව ඇතුළත්ව අදාළ පාර්ශවයන් වෙත ලබාදීම
- ප්‍රමිතීන් ස්ථාපනය සහ පරිපාලනය හා අදාළ ක්‍රියාකාරකම්
- වෙනත් අමාත්‍යාංශ යටතේ පවත්නා පර්යේෂණ ආයතනයන් විසින් පවත්වනු ලබන පර්යේෂණ වැඩසටහන් සඳහා කාර්මික සහාය ලබාදීම
- නව සොයාගැනීම් සිදුකිරීම උදෙසා ප්‍රජාවන් වෙත මාර්ගෝපදේශකත්වය ලබාදීම සහ අභිප්‍රේරණය සඳහා පියවර ගැනීම

- ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රවර්ධනය සහ සංවර්ධනය සඳහා පර්යේෂණ ක්‍රියාත්මක කිරීම
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන් වෙත පැවරී ඇති වෙනත් සියලුම විෂයයන් හා අදාළ කරුණු
- අමාත්‍යාංශය වෙත පැවරී ඇති ආයතනයන්හි සුපරීක්ෂණ කටයුතු

පහත ආයතනයන් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

- නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී.ක්ලාක් ආයතනය
- කාර්මික තාක්ෂණ ආයතනය
- ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
- ජාතික මූලික අධ්‍යයන ආයතනය
- ජාතික පර්යේෂණ සභාව
- ජාතික විද්‍යා පදනම
- ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම
- ශ්‍රී ලංකා අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය
- ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
- ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ (පෞද්) සමාගම (SLINTEC)

අංක 01/2004 දරණ 2004/02/24 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛයෙහි 3.2 වගන්තිය යටතේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළිබඳව සඳහන් කර ඇති මාර්ගෝපදේශයන් හා අනුකූලව මෙම වාර්තාව සකස් කරනු ලැබ ඇති අතර 2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ අමාත්‍යාංශය වෙත ලබාදී ඇති මූල්‍යමය ප්‍රතිපාදන හා අදාළව අත්කරගනු ලැබ ඇති පාලන, මූල්‍යමය හා සංවර්ධන ඇතුළත් කාර්යසාධනය, මෙයට ඇතුළත් කර ඇත.

1.1 අමාත්‍යාංශයේ අරමුණු සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක



2. සංවිධානාත්මක සැකැස්ම

අමාත්‍යාංශය පහතින් සඳහන් කර ඇති අංශ අටකින් සමන්විත වේ.

1. පාලන සහ මුදල් අංශය
2. තාක්ෂණ පැවරුම් අංශය (විදාතා වැඩසටහන)
3. ජාත්‍යන්තර සබඳතා අංශය
4. විද්‍යා සහ පර්යේෂණ සංවර්ධන අංශය
5. සැලසුම් අංශය
6. අභ්‍යන්තර විගණන අංශය
7. ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය
8. විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය (COSTI)

2.1 පාලන හා මුදල් අංශය

බලතල පවරාදීම යටතේ, කාර්යාල පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය සහ අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයන්හි ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ වගකීම මෙම අංශය වෙත පැවරී ඇත.

2.2 තාක්ෂණ පැවරුම් අංශය

විදාතා සම්පත් මධ්‍යස්ථාන 266 ක් හරහා බිම්මට්ටමින්, ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙත විද්‍යාත්මක දැනුම සහ තාක්ෂණය පවරාදීමේ වගකීම, මෙම අංශය වෙත පැවරී ඇත.

2.3 ජාත්‍යන්තර සබඳතා අංශය

විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර සහයෝගීතාවයන් සඳහා පහසුකම් සලසාදීම මෙම අංශයේ වගකීම වේ.

2.4 විද්‍යා සහ පර්යේෂණ සංවර්ධන අංශය

පර්යේෂණ සහ සංවර්ධන ක්‍රමෝපායික රාමුව සකස් කිරිම සහ ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීමේ වගකීම මෙම අංශය වෙත පැවරී ඇත.

2.5 සැලසුම් අංශය

අමාත්‍යාංශය සහ ඒ යටතේ ක්‍රියාත්මක ආයතනයන්හි, සංවර්ධන ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, සුපරීක්ෂණය, සමාලෝචනය සහ වාර්තා කිරීම සඳහා පහසුකම් සපයාදීමේ වගකීම මෙම අංශය වෙත පැවරී ඇත.

2.6 අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශයේ ක්‍රියාකාරීත්වය මනාව පවත්වාගෙන යාම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා දායක වීම මෙම අංශය වෙත පැවරී ඇති වගකීම වේ.

2.7 ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය

කළුලැල්ලක් පමණක් භාවිතයෙන් පැහැදිලි කිරිම දුෂ්කර, තාරකා විද්‍යාත්මක සංසිද්ධීන් පැහැදිලි කිරීමේ ඉතාම ඵලදායී ක්‍රමවේදයක් සලසාදීම මෙම අංශයේ වගකීම වේ. මෙම අංශය හරහා ග්‍රහලෝකාගාර දර්ශන, ජංගම ග්‍රහලෝකාගාර ඉදිරිපත් කිරීම්, රාත්‍රී අහස නිරීක්ෂණ කඳවුරු වැනි එළිමහන් වැඩසටහන් හරහා, විශ්වය පිළිබඳ ගැඹුරු දැනුමක් ප්‍රේක්ෂකයන් වෙත ලබාදෙන අතර Astro IT ඒකකය සමඟ එක්වීමේ පහසුකම් සලසා දේ.

2.8 විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය (COSTI)

ශ්‍රී ලංකා ජාතික විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන (STI) ක්‍රමෝපාය හා අනුකූලව, අගයන් එක් කිරීම් සහ වාණිජකරණය ප්‍රවර්ධනය කිරීම උදෙසා කටයුතු කිරීම මෙම අංශයෙහි වගකීම වේ.

3. 2016 වර්ෂය තුළ අමාත්‍යාංශයේ කාර්යසාධනය

3.1 පාලන සහ මුදල් අංශය

3.1.1 2016.12.31 දිනට සේවක සංඛ්‍යා තොරතුරු

මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	සේවක සංඛ්‍යා හිඟය/ අතිරික්තය
ජ්‍යෙෂ්ඨ මට්ටම	26	23	පුරප්පාඩු 04
තෘතීය මට්ටම	32	6	-
ද්විතියික මට්ටම	753	663	පුරප්පාඩු 90
ප්‍රාථමික මට්ටම	245	318	පුරප්පාඩු 02
එකතුව	**1056**	**1010**	

3.1.2 2016 වර්ෂය තුළ සේවක සංඛ්‍යාවෙහි සිදුවූ වෙනස්කම්

තනතුරු නාමය	අනුමත සේවක සංඛ්‍යාව	මාරුවීම් ලැබූ	විශ්‍රාම ලැබූ	ඉල්ලා අස් වූ
ජ්‍යෙෂ්ඨ මට්ටම	26	0	0	0
තෘතීය මට්ටම	32	3	0	0
ද්විතියික මට්ටම	753	19	2	0
ප්‍රාථමික මට්ටම	245	3	3	0
එකතුව	**1056**	**25**	**5**	0

3.1.3 පුහුණු

3.1.3.1 විදේශ පුහුණුව 2016

වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ මාණ්ඩලික නිළධාරීන් සංඛ්‍යාව	සහභාගී වූ අනෙකුත් නිළධාරීන් සංඛ්‍යාව	අමාත්‍යාංශය විසින් දරණු ලැබූ මුළු පිරිවැය (රු.)
28	17	07	9,393,407.25

3.1.3.2 දේශීය පුහුණුව - පුහුණු, වැඩමුළු සහ සම්මන්ත්‍රණ

වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූවන්ගේ සංඛ්‍යාව	අමාත්‍යාංශය විසින් දරනු ලැබූ මුළු පිරිවැය (රු.)
13	33	396,600.00

3.2 තාක්ෂණ පැවරුම් – විදාතා වැඩසටහන

විදාතා වැඩසටහන වෙනුවෙන් 2016 වර්ෂය සඳහා වෙන් කර දී ඇති මුළු ප්‍රාග්ධන අයවැය වෙන්කිරීම් රුපියල් මිලියන 71 ක් වූ අතර වැය කරන ලද වියදම රුපියල් මිලියන 63.106 ක් විය.

3.2.1 2016 වර්ෂය තුළදී විදාතා වැඩසටහන යටතේ සිදුකරනු ලැබූ ප්‍රධාන කාර්යයන්

- තාක්ෂණ පැවරුම් වැඩසටහන්
- ග්‍රාමීය ප්‍රජාව සඳහා විද්‍යා හා තාක්ෂණ විශේෂ ව්‍යාපෘති
- විදාතා හරිත කඩමණ්ඩිය වැඩසටහන
- වස විසෙන් තොර සාම්ප්‍රදායික ආහාර වැඩසටහන
- විදාතා කාර්යමණ්ඩලය සඳහා ධාරිතා ප්‍රවර්ධනය
- විද්‍යාව ප්‍රචලිත කිරීම
- විදාතා සම්පත් මධ්‍යස්ථාන ඉදිකිරීම

3.2.1.1 තාක්ෂණ පැවරුම් වැඩසටහන

	වැඩසටහන		වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වියදම (රු.)
1.	ප්‍රජාව සඳහා තාක්ෂණය	මහජන දැනුවත් කිරීමේ වැඩසටහන්	2098	39862	11,750,000.00
2.	ව්‍යවසායකයින් සඳහා තාක්ෂණය	තාක්ෂණ හුවමාරු වැඩසටහන් • ආහාර මත පදනම් වූ තාක්ෂණය • ද්‍රව්‍ය මත පදනම් වූ තාක්ෂණය • රසායනික ද්‍රව්‍ය මත පදනම් වූ තාක්ෂණය • කෘෂිකර්මය	3506	76963	

3.2.1.2 ග්‍රාමීය ප්‍රජාවන් සඳහා විද්‍යා හා තාක්ෂණ ව්‍යාපෘති

අනුක්‍රමික අංකය	ව්‍යාපෘති	විදාතා සම්පත් මධ්‍යස්ථානය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වියදම (රු.)
01	කාබනික වගාව	විදාතා සම්පත් මධ්‍යස්ථාන 235	සාමාන්‍ය වගාව	4,70,000.00
02	කිරි ආශ්‍රිත නිෂ්පාදන	වෙංගලාචෙඩ්ඩිකුලම් පුදුකුඩිඉරුප්පු	10 03	2,95,750.00 4,05,420.00
03	ජීව වායු නිෂ්පාදන	කැස්බෑව බියගම මහවැව (සිව්රජ ළමා නිවාසය)	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි සාමාන්‍ය ජනතාව 100	1,42,000.00
04	බිම්මල් වගාව	හල්දුම්මුල්ල	10	2,40,000.00
05	බිම්මල් වගාව	මීගහකිවුල	05	1,52,000.00
06	කැපුම් මල් නිෂ්පාදනය	ඌව පරණගම	10	2,91,230.00
07	කැපුම් මල් නිෂ්පාදනය	වැලිමඩ	12	3,49,476.00
08	හඳුන්කූරු නිෂ්පාදනය	නාත්තන්ඩිය	22	36,000.00
09	විදාතා වෙළඳ කුටියෙහි අභ්‍යන්තර පහසුකම් වැඩිදියුණු කිරීම	බණ්ඩාරගම	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි සාමාන්‍ය ජනතාව	1,91,908.00
10	අභ්‍යාස පොත් නිෂ්පාදනය	මදුරාවල	10	12,000.00
11	ඉටිපන්දම් නිෂ්පාදනය	ගම්පහ	06	17,800.00
12	යන්ත්‍රසූත්‍ර භාවිතයෙන් තලගුලි නිෂ්පාදනය	මහර	01	3,75,000.00
13	යෝගට් නිෂ්පාදනය සඳහා නවීන තාක්ෂණය	දොම්පේ	01	100,000.00

14	කිරි ආශ්‍රිත නිෂ්පාදන	මන්නාරම	06	3,93,600.00
15	බිම්මල් බීජ නිෂ්පාදනය	මාවනැල්ල	110	1,354,680.00
16	''අපේ මෙහෙවර ඔබේ දැනට'' කෙටි පණිවුඩ සේවාව හරහා පුහුණු වැඩසටහන් පිළිබඳ දැනුම් දීම	ඉපලෝගම	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි සාමාන්‍ය ජනතාව	5,000.00
17	දැල් ගෘහයන්හි සිදුකෙරෙන කැපුම් මල් කර්මාන්තය	පඩුවස්නුවර-නැගෙනහිර		2,49,925.00
18	පන් ආශ්‍රිත නිෂ්පාදන	අඹුණුකොළපැලැස්ස	07	26,349.50
19	බෝරෝන් ප්‍රතිකර්මය සිදුකළ උණ	අඹුණුකොළපැලැස්ස	06	1,55,000.00
20	පැෂන් ෆෘට් වගාව සහ පැළ තවාන	ඕකේවල	75	42,750.00
21	විද්‍යාතා වෙළඳ කුටිය සඳහා අලෙවි පහසුකම්	තුම්පනේ	58	18,882.00
22	සත්ත්ව ආහාර නිෂ්පාදනය	මිණිපේ	01	38,000.00
23	ජීව වායු ඒකකය	නොච්චියාගම	01	43,480.00
24	හඳුන්කූරු නිෂ්පාදනය	සන්දිලිපායි	09	200,000.00

නාත්තන්ඩිය ප්‍රදේශයේ හඳුන්කූරු නිෂ්පාදනය සිදුකරමින්

3.2.1.3 විද්‍යාතා හරිත කඩමණ්ඩිය වැඩසටහන

වැඩසටහන	ස්ථානය	ව්‍යාවසායකයින් සංඛ්‍යාව	වියදම (රු.)
එක් ජාතික වැඩසටහනක්	කාර්මික තාක්ෂණ ආයතන පරිශ්‍රය	65	3,81,346.25
දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් අටක්	හම්බන්තොට, කළුතර, සහනුවර, මාතලේ, රත්නපුර, අම්පාර, කුරුණෑගල, කොළඹ	482	1,335,685.00

3.2.1.4 වස විසෙන් තොර සාම්ප්‍රදායික ආහාර වැඩසටහන්

- සියලුම විද්‍යා හා තාක්ෂණ නිළධාරින් සහ ව්‍යවසායකයින් සඳහා සහායක නියමු වැඩසටහන් සංවිධානය කිරීම
- බස්නාහිර පළාතේ විද්‍යා හා තාක්ෂණ නිළධාරින් සහ ව්‍යවසායකයින් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම
- තුම්පනේ,මහර, මහරගම, කොළඹ, තිහගොඩ සහ කන්තලේ විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානයන්හි අලෙවි කුටි ආරම්භ කරන ලදි.

3.2.1.5 විද්‍යාත්මක කාර්යමණ්ඩලය සඳහා ධාරිතා ප්‍රවර්ධනය

කාර්යමණ්ඩල කාණ්ඩය	වැඩමුළුවේ මාතෘකාව	සම්පත් දායක ආයතනය	ස්ථානය	සහභාගී වූවන්ගේ සංඛ්‍යාව	වියදම (රු.)
ක්ෂේත්‍ර සම්බන්ධීකාරකවරුන්	ඵලදායිතාවය පිළිබඳ වැඩමුළු	ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය	ශ්‍රී ලංකා පදනම් ආයතනය	250	5,88,250.00
කාර්යාල සහායකයින්	ඵලදායිතාවය පිළිබඳ වැඩමුළු	ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය	ශ්‍රී ලංකා පදනම් ආයතනය	199	5,05,750.50
විද්‍යා හා තාක්ෂණ නිළධාරීන්	ඖෂධීය ශාක නිෂ්පාදන පිළිබඳ වැඩමුළු	කාර්මික තාක්ෂණ ආයතනය	කාර්මික තාක්ෂණ ආයතනය	07	6,30,000.00

3.2.1.6 විද්‍යාව ප්‍රචලිත කිරීම

- මව් භාෂාව ලෙස දමිළ භාෂාව හසුරුවන ව්‍යවසායකයින්ට පහසුකම් සපයා දෙමින් විද්‍යාත්මක ''අත හුරුව'' තාක්ෂණ අත්පොතෙහි දමිළ පරිවර්තනය මුද්‍රණය සඳහා සූදානම් කර ඇත.
- තරුණ පරපුර අතර විද්‍යාත්මක දැනුම වර්ධනය කරවීම සඳහා ''ප්‍රභාෂ්වර'' බ්ලොග් පිටුවෙහි ලිපි 364 ක් පළ කරන ලදි.

නව විද්‍යාත්මක සම්පත් මධ්‍යස්ථාන විවෘත කිරීම

නල්ලූර් විද්‍යාත්මක සම්පත් මධ්‍යස්ථානය

සයින්දමරුදු විද්‍යාත්මක සම්පත් මධ්‍යස්ථානය

සන්දිලිපායි විද්‍යාත්මක සම්පත් මධ්‍යස්ථානය

3.2.1.7 වෙනත් තාක්ෂණ පැවරුම් ක්‍රියාකාරකම්

- ව්‍යවසායකයින් 161 දෙනෙකුගේ තාක්ෂණික ගැටලු සඳහා විසඳුම් ලබා දෙනු පිණිස කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයන්හි තාක්ෂණික සායනයක් පවත්වනු ලැබිණි. ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, කාර්මික තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ අපනයන සංවර්ධන මණ්ඩලය යන ආයතන විසින් ගැටලු සඳහා විසඳුම් ලබාදෙන ලදි.

- ආහාර, ඖෂධ, කෘෂිකර්මික සහ විද්‍යුත් ක්ෂේත්‍රයේ විද්‍යාත්මක නිෂ්පාදනයන්හි තත්ත්වය ඉහළ නැංවීම සඳහා, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා සහයෝගීතාවයෙන් යහපත් නිෂ්පාදන පිළිවෙත් සහතිකකරණ 55 ක් සහ විද්‍යාත්මක පද්ධති සහතිකකරණ 15 ක් නිකුත් කරන ලදි.

3.3 තාක්ෂණ සහ පර්යේෂණ සංවර්ධනය

3.3.1 විද්‍යාත්මක සංවර්ධන වැඩසටහන

3.3.1.1 පර්යේෂණ සහ සංවර්ධන ක්ෂේත්‍රයේ සිදුකළ ආයෝජනයන්

- **සමාජ මෙහෙවර උදෙසා විද්‍යා තාක්ෂණ සම්මන්ත්‍රණය (STS Forum)**

ජපානය වෙත සිදුකළ ගරු අග්‍රාමාත්‍යවරයාගේ නිල සංචාරය අතරතුරදී එතුමන් විසින් ''සමාජ මෙහෙවර උදෙසා විද්‍යා හා තාක්ෂණ සම්මන්ත්‍රණය 2016'' හි සමාරම්භක උත්සවයට සහභාගී වී ප්‍රධාන දේශනය සිදුකරණු ලැබිණි. 2015 ඔක්තෝබර් 5 සිට 7 දක්වා, ජපානයේදී පැවති STS සම්මන්ත්‍රණය සඳහා ගරු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරයාද සහභාගී විය. මේ හරහා අත්කර ගතහැකි ප්‍රතිලාභයන් පිළිබඳ සලකා බලමින්, ශ්‍රී ලාංකීය සමාජය උදෙසා මෙවැනි විද්‍යා හා තාක්ෂණ සම්මන්ත්‍රණයක් සංවිධානය කොට 2016 වර්ෂයේදී පවත්වන ලෙස, ගරු අග්‍රාමාත්‍යවරයා විසින් උපදෙස් ලබාදෙන ලදි.

මෙම සම්මන්ත්‍රණය පැවැත්වීමේ මූලික අරමුණ වූයේ, ගෝලීය විද්‍යා හා තාක්ෂණ සංවර්ධනයන් වෙතින් ශ්‍රී ලාංකීය සමාජයේ ප්‍රගමනය උදෙසා ලබාගත හැකි අවස්ථාවන් ගවේෂණය කිරීමේ පහසුකම් ලබාදීමත්, ශ්‍රී ලාංකීය සමාජයේ විද්‍යා සහ තාක්ෂණ ක්ෂේත්‍රයට හිමිවන කාර්යභාරය සාකච්ඡාවට ලක් කිරීමත්, අපගේ සමාජය තුළ විද්‍යා හා තාක්ෂණ යෙදවුම් භාවිතයේදී මුහුණපෑමට සිදුවන බාධක විශ්ලේෂණය කිරීමත්ය.

මෙම සම්මන්ත්‍රණය අතරතුරදී, තිරසර සංවර්ධන ඉලක්කයන් (SDGs) හා අනුකූලව ඒ හා අදාළ තේමාවන් සාකච්ඡාවට ලක් කරනු ලැබූ අතර, පුරවැසි විද්‍යාව, උසස් තාක්ෂණය මත පදනම් වූ විසඳුම්, මූලික විද්‍යාවන්, විද්‍යා තාක්ෂණ නවෝත්පාදනයන්හි ධාරිතා ගොඩනැංවීම්, විද්‍යා හා තාක්ෂණය මූල්‍යනය කටයුතු සහ ශ්‍රී ලංකා නවෝත්පාදන වේදිකාව යනාදී විශේෂිත ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමුකරමින්, තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) හා අනුකූලත්වයක් දක්වන තේමාවන් පිළිබඳව මෙහිදී සාකච්ඡාවට ලක් විණි.

2016 සැප්තැම්බර් 8 සිට 10 දක්වා කොළඹදී පවත්වනු ලැබූ මෙම සම්මන්ත්‍රණයෙහි සමාරම්භක උත්සවය 2016 සැප්තැම්බර් 7 වන දින පවත්වන ලදි. මෙම සම්මන්ත්‍රණය සඳහා ජපානයේ STS සම්මන්ත්‍රණයේ සභාපති ඇතුළු ප්‍රමුඛ පෙළේ ජාත්‍යන්තර විශේෂඥයින්, ආසියා පැසිෆික් ආර්ථික හා සමාජීය කොමිසමෙහි (ESCAP) , UNESCO, CERN හි නිලධාරීන්ගේ සහභාගීත්වය හිමිවිණි.

අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් සහ වෙනත් සම්භාවනීය අමුත්තන්ගේ සහභාගීත්වයෙන් සමාරම්භක උළෙල පවත්වන ලදි. දේශීය හා ජාත්‍යන්තර මට්ටමේ විද්‍යාඥයින්, පර්යේෂකයින් සහ තාක්ෂණඥයින්, කර්මාන්තකරුවන්, විශ්වවිද්‍යාල සිසුන් සහ දේශීය පාසල්හි ඉහළ ශ්‍රේණීන්හි සිසුන් ඇතුළු 1500 ක් වූ ආරාධිතයන්ගේ සහභාගීත්වයෙන් මෙම සමාරම්භක උළෙල පැවැත්විණි.

මෙම සම්මන්ත්‍රණය සඳහා 650 දෙනෙකු සහභාගී වූ අතර ඒ අතුරින් 100 දෙනෙකු විදේශයන්හි වෙසෙන විශිෂ්ට ගණයේ ශ්‍රී ලාංකීය විද්‍යාඥයින්ද ඇතුළත් වූ විදේශයන් වෙතින් පැමිණි පුද්ගලයින් විය. විද්‍යාඥයින්, රජයේ සහ පෞද්ගලික අංශයේ තාක්ෂණඥයින් සහ කර්මාන්තකරුවන්, නවනිපැයුම්කරුවන් සහ නවෝත්පාදකයින්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සහ දේශීය පාසල්හි ඉහළ ශ්‍රේණීන්හි ශිෂ්‍යයින්, ශ්‍රී ලංකාව නියෝජනය කරමින් මේ සඳහා සහභාගී විණි.

STS සම්මන්ත්‍රණය

- **විද්‍යාව ප්‍රචලිත කිරීම**
  - "වස විස නැති රටක්" ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන කුටි සංවිධානය කරන ලදි.
  - අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව විද්‍යා හා තාක්ෂණ අධ්‍යාපනික ප්‍රදර්ශන පැවැත්වීම.
  - සී/ස එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම හා එක්ව මාසික පුවත්පත් අතිරේක (විද්‍යා) 10 ක් භාෂා ත්‍රිත්වයෙන්ම පළ කිරීම.

විද්‍යා පුවත්පත

3.3.1.2 ද්විපාර්ශ්වීය සහයෝගීතාවය

ඉන්දු ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාවය

2011 සැප්තැම්බර් මසදී, අමාත්‍යාංශය විසින්, ඉන්දියාවේ විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සහයෝගීතා වැඩසටහනකට (PoC) එළැඹී අතර, ඒ යටතේ, දෙරටෙහිම විද්‍යාඥයින් හට ඒකාබද්ධ සහයෝගීතා පර්යේෂණ සහ වැඩමුළු සඳහා සහභාගී වීමේ අවස්ථාව උදාවේ. පර්යේෂණ ව්‍යාපෘති නවයක් ආරම්භ කරනු ලැබූ අතර 2016 මැයි 11 වන දින මධ්‍ය වාර ප්‍රගති සමාලෝචන රැස්වීම පවත්වන ලදි. 2016 වසරේදී රජයේ මූල්‍යාධාර ලබන ව්‍යාපෘති අටක් අතුරින් හතක් සම්පූර්ණ කෙරිණි. එක් ව්‍යපෘතියක් 2017 වසර මැද දක්වා දීර්ඝ කරනු ලැබිණි.

- **විද්‍යා හා තාක්ෂණය පිළිබඳ ඉන්දු ශ්‍රී ලංකා ඒකාබද්ධ කමිටුව**

තෙවැනි වරට පවත්වනු ලැබූ විද්‍යා හා තාක්ෂණය පිළිබඳ ඉන්දු ශ්‍රී ලංකා ඒකාබද්ධ කමිටු රැස්වීම, ශ්‍රී ලංකාවේ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය හා ඉන්දියාවේ විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුව අතර, ඉන්දියාවේ නවදිල්ලි නුවරදී 2016 අගෝස්තු 04 වන දින පවත්වන ලදි. මෙම රැස්වීම අතරතුරදී නව සහයෝගීතා වැඩසටහන සාකච්ඡාවට ලක්කර අවසන් කරනු ලැබිණි. මෙම නව සහයෝගීතා වැඩසටහන හරහා නව සහයෝගීතා ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳ අවධානය යොමු කෙරෙන අතර සහයෝගීතා වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඒ සඳහා සක්‍රීය දායකත්වය දැක්වීමට දෙපාර්ශවයෙන්ම එකඟතාවය පළවිණි. එලෙස එකඟතාවය පළවූ ක්ෂේත්‍ර වූයේ ඖෂධ, මිණුම් විද්‍යාව, අභ්‍යාවකාශ පර්යේෂණ

සහ යෙදවුම්, රොබෝ තාක්ෂණය සහ ස්වයංක්‍රීයකරණය සහ කාර්මික ඉලෙක්ට්‍රොනික විද්‍යාව යනාදියයි. 2016 වසරේදී පර්යේෂණ යෝජනා කැඳවීමටත්, ඒවා තෝරාගැනීමෙන් අනතුරුව 2017 වර්ෂයේ සිට මූල්‍යාධාර ලබාදීමටත් එකඟතාවය පළවිණි.

සහයෝගීතා වැඩසටහනට අනුව, දෙරටෙන්ම යෝජනා සඳහා ඒකාබද්ධ කැඳවීමක් සිදුකරන ලදි. අවසන් දිනය වන විට ඒකාබද්ධ පර්යේෂණ සඳහා යෝජනා 90 ක් සහ ඒකාබද්ධ වැඩමුළු සඳහා යෝජනා අටක්ද අමාත්‍යාංශය වෙත ලැබී තිබුණි.

- **ඉන්දියානු විද්‍යාත්මක සහ පර්යේෂණ අධිශිෂ්‍යත්ව වැඩසටහන (ISRF)**

ඉන්දියාවේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විසින් ''ඉන්දියානු විද්‍යාත්මක හා පර්යේෂණ අධිශිෂ්‍යත්ව වැඩසටහන (ISRF)'' හරහා ශ්‍රී ලාංකීය විද්‍යාඥයින් සහ පර්යේෂකයින් සඳහා අධිශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩසටහනක් ආරම්භ කරනු ලැබ ඇත. මෙම වැඩසටහන පිළිබඳ තොරතුරු, විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි, ජාතික විද්‍යා පදනමෙහි වෙබ් අඩවියෙහි පළ කරනු ලැබූ අතර ප්‍රවෘත්ති පත්‍රයන්හිද දැන්වීම් පළ කෙරිණි. අයදුම්පත් හතක් ලැබුණු අතර විශේෂඥයින්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් විසින් සිදුකරනු ලැබූ ඇගයීමකින් අනතුරුව, අයදුම්පත් හතරක් අධිශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා අනුමැතිය ලබාගනු පිණිස ඉන්දියානු බලධාරීන් වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත.

පකිස්ථානු ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාවය

- **ශ්‍රී ලංකා පකිස්ථානු විද්‍යා හා තාක්ෂණ කමිටුවෙහි ප්‍රථම හමුව**

ශ්‍රී ලංකා පකිස්ථානු විද්‍යා හා තාක්ෂණ කමිටුවෙහි ප්‍රථම හමුව, 2016 නොවැම්බර් 17 දින කොළඹදී පකිස්ථානයේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය සමඟ පවත්වන ලදි. මෙම රැස්වීම අතරතුරදී සහයෝගීතා වැඩසටහනක් සකසා අවසන් කෙරිණි.

- **අත්සන් තබනු ලැබූ සහ ක්‍රියාත්මක කරනු ලැබූ එකඟතාවයන් සහ අවබෝධතා ගිවිසුම්**

ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය සහ පාකිස්ථානයේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය අතර ''විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන සහයෝගීතාවය'' පිළිබඳ අවබෝධතා ගිවිසුමක් 2016 ජනවාරි 05 දින අත්සන් තබනු ලැබුණු අතර ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම සහ පාකිස්ථානු විද්‍යා පදනම අතර විද්‍යාත්මක සහ තාක්ෂණික සහයෝගීතාවය සඳහා ඒ හරහා පහසුකම් සලසා දේ.

වෙනත් සහයෝගීතාවයන්

ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම සහ චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනම අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තබනු පිණිස අමාත්‍යාංශය විසින් පහසුකම් සලසා දෙනු ලැබිණි. ඉක්වදෝරය, බෙලරුස්, ලැට්වියාව, නවසීලන්තය, කියුබාව සහ ස්ලොවේනියාව යන රටවල් සමඟ විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය පිළිබඳ එකඟතාවයන් ආරම්භ කරනු ලැබ ඇත. න්‍යෂ්ටික පර්යේෂණ පිළිබඳ යුරෝපා සංවිධානය (CERN) සමඟ සහයෝගීතා ගිවිසුමක් අත්සන් තැබීම සඳහා සාකච්ඡා ආරම්භ කරනු ලැබ ඇත.

3.3.1.3 විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය (COSTI) හරහා ක්‍රියාත්මක සංවර්ධන මූලාරම්භය

- (COSTI) විසින් සම්බන්ධීකරණය කරනු ලැබ ලංකා වාණිජ මණ්ඩලය තුළ ස්ථාපනය කරනු ලැබූ ජාතික ජෛව තාක්ෂණ කර්මාන්ත සංගමය, STS සම්මන්ත්‍රණයේ සමාරම්භක දිනයේදී නිල වශයෙන් දියත් කරනු ලැබිණි.



- ''Innovation Eye'' හි දියත් කිරීම. (මෙම පුවත්ලිපිය STS සම්මන්ත්‍රණයේදී දියත් කරනු ලැබිණි.)

INNOVATION EYE

COSTI assigned to the Ministry of Science, Technology and Research as its 15th entity

- උචිත තාක්ෂණ සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ KIPO/KIPA සමඟ හමුව , 2016 නොවැම්බර් 14 දින NEDA ශ්‍රවණාගාරයේදී පැවැත්වීම

- ශ්‍රී ලංකා නවෝත්පාදන පුවරුව සඳහා 2016 වසරේ E- ස්වාභිමානී සම්මානය COSTI විසින් හිමිකරගන්නා ලදි.

3.4 ග්‍රහලෝකාගාරය

2016 වසර සඳහා ග්‍රහලෝකාගාරය වෙත වෙන් කරදී ඇති මුළු ප්‍රාග්ධන අයවැය වෙන් කිරීම් ප්‍රමාණය රුපියල් මිලියන 22.2 ක් වන අතර වියදම රුපියල් මිලියන 3.49 කි. 2016 වසරේදී ග්‍රහලෝකාගාරය විසින් ග්‍රහලෝකාගාර දර්ශන, එළිමහන් වැඩසටහන් සහ තාරකාවිද්‍යා පංති සහ සම්මන්ත්‍රණ පවත්වන ලදි.

3.4.1 ග්‍රහලෝකාගාර ඉදිරිපත් කිරීම්

පූර්ණ අර්ධගෝල තිරය මත ප්‍රදර්ශනය කරනු ලැබූ තාරකා විද්‍යාව හා අදාළ චිත්‍රපට, සෞරග්‍රහ මණ්ඩලය හඳුන්වාදීමේ වැඩසටහන් සහ එදිනෙදා රාත්‍රී අහස පිළිබඳ ඉදිරිපත් කිරීම් ඇතුළත් වූ ග්‍රහලෝකාගාර දර්ශන, පාසල් සිසුන් සහ මහජනතාව උදෙසා 2016 වර්ෂය මුළුල්ලේ ග්‍රහලෝකාගාරය විසින් ප්‍රදර්ශනය කරනු ලැබූ අතර අපේක්ෂිත ඉලක්ක ඉක්මවා යාමේ හැකියාව උදාවිණි. එමෙන්ම, විශේෂිත අවශ්‍යතා සහිත සිසුන් සඳහා විශේෂ ග්‍රහලෝකාගාර දර්ශන පැවැත්වූ අතර, ඒ හරහා ජීවිත අත්දැකීම් වින්දනය කිරීම සඳහා ඔවුන්ට දිරිදීමත්, ඔවුන් සීමා වී ඇති සීමාමායිම් වෙතින් මුදවා ගැනීමත්, අපේක්ෂා කෙරිණි.

සාමාන්‍ය ග්‍රහලොකාගාර ඉදිරිපත් කිරීම් හරහා 2016 වර්ෂයේදී අත්කර ගනු ලැබූ ජයග්‍රහණ සහ ඉලක්ක

ක්‍රියාකාරකම	2016 වසර සඳහා ඉලක්ක			2016 වසරේදී අත් කරගනු ලැබූ ජයග්‍රහණ		
	දර්ශන සංඛ්‍යාව	සහභාගීවූවන් ගේ සංඛ්‍යාව	ආදායම (රු.මි.)	දර්ශන සංඛ්‍යාව	සහභාගීවූවන් ගේ සංඛ්‍යාව	ආදායම (රු.මි.)
පාසල් සිසුන් සහ මහජනතාව සඳහා ග්‍රහලෝකාගාර දර්ශන	400	200,000	7.5	491	213,978	11.21
විශේෂ ග්‍රහලෝකාගාර දර්ශන සහ ජල රොකට් දියත්කිරීම පිළිබඳ ප්‍රදර්ශනය	5	2000	නොමිලේ පවත්වන ලදි	5	2,096	නොමිලේ පවත්වන ලදි

ග්‍රහලෝකාගාර දර්ශන

විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා සිදුකරනු ලැබූ ග්‍රහලෝකාගාර දර්ශන

3.4.1.1 එළිමහන් වැඩසටහන්

තාරකා විද්‍යාව පිළිබඳ දැනුම සහ උනන්දුව වැඩිදියුණු කිරීමේ අරමුණින්, ග්‍රහලෝකාගාරය විසින් දිවයින පුරා, ග්‍රාමීය ප්‍රදේශවල සිසුන් සඳහා ජංගම ග්‍රහලෝකාගාර දර්ශන පාසල් පරිශ්‍රයන්හි සහ ග්‍රහලෝකාගාර පරිශ්‍රයේ රාත්‍රී අහස නිරීක්ෂණ කඳවුරු, විශේෂ ස්වභාවික සංසිද්ධි නිරීක්ෂණ කඳවුරු යනාදිය වසර මුළුල්ලේ පවත්වන ලදි. මෙය සමාජ වගකීමක් ලෙස සලකමින්, මෙම සියලු වැඩසටහන් නොමිලේ පවත්වන ලදි. ග්‍රහලෝකාගාරය විසින් අත්කරගනු ලැබූ, එළිමහන් වැඩහටහන් හා සම්බන්ධිත අපේක්ෂිත ඉලක්කයන් පහත වගුවේ සාරාංශගත කොට ඇත.

2016 වසර සඳහා එළිමහන් වැඩසටහන් හා සම්බන්ධයෙන් අපේක්ෂිත ඉලක්කයන් හා අත්කරගනු ලැබූ ජයග්‍රහණ

එළිමහන් වැඩසටහන්	2016 වසර සඳහා අපේක්ෂිත ඉලක්ක		2016 වසරේ අත්කර ගනු ලැබූ ජයග්‍රහණ	
	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූවන්ගේ සංඛ්‍යාව	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගීවූවන් ගේ සංඛ්‍යාව
ජංගම ග්‍රහලෝකාගාර	300	11,000	380	11,950
රාත්‍රී අහස නිරීක්ෂණ කඳවුරු	10	1,500	10	1,300
ස්වභාවික සංසිද්ධි නිරීක්ෂණ කඳවුරු	01	100	1	150

ජංගම ග්‍රහලෝකාගාර

රාත්‍රී අහස නිරීක්ෂණ කඳවුරු

"Astro Kids" වැඩසටහන

3.4.2 තාරකා විද්‍යා පන්ති සහ සම්මන්ත්‍රණ

නොමිලේ පවත්වනු ලබන "Astro IT" පාඨමාලාව සහ "Astro Kids" වැඩසටහන සාර්ථකව පවත්වන ලදි. 2016 වසරේදී තාරකා විද්‍යාව සහ අභ්‍යවකාශ විද්‍යාව පිළිබඳ සිය දැනුම සැලකිය යුතු අන්දමින් ඉහළ නංවාගත් පාසල් සිසුහු 170 දෙනෙකු මෙම වැඩසටහන් සඳහා සහභාගී වූහ. තාරකා විද්‍යාව හා සම්බන්ධිත ජාත්‍යන්තර ඔලිම්පියාඩ් විභාගය සඳහා, 130 දෙනෙකුට අධික සිසුන් සංඛ්‍යාවක් සඳහා නොමිලේ සම්මන්ත්‍රණ පැවැත්වීමට ග්‍රහලෝකාගාරය විසින් පියවර ගනු ලැබූ අතර, ඒ අතරින් රන් පදක්කම් දෙකක් ඇතුළත්ව පදක්කම් දිනාගැනීමට සිසුන් 25 දෙනෙකු සමත් වී ඇත.

3.5 ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය (SLINTEC)

2016 වර්ෂය සඳහා නිනිති තාක්ෂණ ආයතන වැඩසටහන වෙනුවෙන් වෙන්කර දී ඇති මුළු ප්‍රාග්ධන අයවැය වෙන්කිරීම් ප්‍රමාණය රුපියල් මිලියන 544 ක් වන අතර වියදම රුපියල් මිලියන 303.154 කි.

3.5.1. 2016 වර්ෂය තුළදී පවත්වනු ලැබූ වැඩසටහන්

පවත්වනු ලැබූ ක්‍රමෝපායික පර්යේෂණ ව්‍යාපෘතීන්

- **ටයිටේනියම් පිළිබඳ පර්යේෂණ**

නව නිස්සාරණ ක්‍රමවේදයක් හරහා ඉල්මනයිට් වෙතින් ටයිටේනියම් නිස්සාරණය කරගැනීම පිළිබඳව මෙම ව්‍යාපෘතිය හරහා අවධානය යොමු කෙරේ. නියාමක බලාගාරයෙහි වැඩිදියුණු කිරීමේ කටයුතු 2017 වසරේදී සිදු කිරීමට නිනිති තාක්ෂණ ආයතනය විසින් සැලසුම් සකස් කෙරේ.

- **තෝරියම් පිළිබඳ පර්යේෂණ**

මෙම ව්‍යාපෘතිය හරහා මොනසයිට් වැලි ඇසුරින් තෝරියම් සහ දුර්ලභ ඔක්සයිඩ නිස්සාරණය කරගැනීම පිළිබඳ අවධානය යොමු කෙරේ. නිනිති තාක්ෂණ ආයතනය විසින් විද්‍යාගාර ක්‍රියාවලිය සංවර්ධනය කරනු ලැබ ඇති අතර ඊළඟ පියවර වනුයේ, වැඩි දියුණු කිරීමය.

- **කෘත්‍රිම රසායන විද්‍යාව පිළිබඳ පර්යේෂණ**

නිනිති තාක්ෂණ ආයතනය විසින් මෙම වර්ෂය තුළදී යහපත් විද්‍යාගාර පිළිවෙත් පිළිබඳ සහතිකකරණය සඳහා අයදුම් කරනු ලැබූ අතර, සක්‍රිය ඖෂධ විද්‍යාත්මක ද්‍රව්‍ය නිෂ්පාදන හැකියාව වැඩිදියුණු කරගැනීම පිළිබඳ කටයුතු කරමින් සිටී.

රජය විසින් අරමුදල් ලබාදෙනු ලැබූ පහත ක්‍රමෝපායික පර්යේෂණ ව්‍යාපෘතීන් නිනිති තාක්ෂණ ආයතනය විසින්, මෙම වර්ෂය තුළදී ආරම්භ කරන ලදි.

- **කාබන් නිනිති තන්තු පිළිබඳ පර්යේෂණ**

ශක්තිමත් උසස් ද්‍රව්‍යයක් ලෙස බොහෝමයක් කර්මාන්තයන්හි භාවිත කෙරෙන කාබන් නිනිති ටියුබ (CNT) නූල් වැඩිදියුණු කිරීම පිළිබඳ මෙම ව්‍යාපෘතියේ අවධානය යොමු වී ඇත.

- **මිනිරන් පිළිබඳ පර්යේෂණ**

මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා නිධි මිනිරන් ඇසුරෙන් ග්‍රැෆීන් ඔක්සයිඩ සහ ග්‍රැෆීන් උත්පාදනය කරගැනීම පිළිබඳ පර්යේෂණ සිදුකෙරේ.

2016 සැප්තැම්බර් මසදී නිනිති තාක්ෂණ ආයතනය විසින් තාක්ෂණ බීජෞෂණ මධ්‍යස්ථානයෙහි (TIC) මෙහෙයුම් ආරම්භ කරනු ලැබූ අතර TIC හි සිය පර්යේෂණ විද්‍යාගාර ස්ථාපනය කරනු පිණිස ගිවිසුම් සඳහා අත්සන් තැබීමට, දෙපාර්ශ්වයක් විසින් කටයුතු කර ඇති අතර දැනටමත් එක් බදුකරුවෙකු විසින් සිය පර්යේෂණ විද්‍යාගාරය TIC හි ස්ථාපනය කරනු ලැබ ඇත. මේ පිළිබඳ විභවතාවයක් සහිත නව සේවාදායකයින් කිහිපදෙනෙකු සමඟ සාකච්ඡාවන් පැවැත්වේ.

2016 වර්ෂය තුළදී, නිනිති තාක්ෂණ ආයතනය විසින්, යුනාන් ග්‍රාමීය විද්‍යා හා තාක්ෂණ පැවරුම් සේවා මධ්‍යස්ථානය හා සහයෝගිතාවයෙන් අති නවීන හරිතාගාරයක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරනු ලැබිණි. සූර්ය බලශක්තියෙන් හරිතාගාරය බලගැන්වෙනු ඇති අතර ශාක වර්ධනය සඳහා නව තාක්ෂණයන් වන වායුමය වගාව සහ ජල වගාව යොදා ගැනෙනු ඇත.

සිය නිෂ්පාදන ක්‍රියාවලියේදී උසස් විද්‍යාවන් සහ ඉංජිනේරු විද්‍යාවන් යොදා ගැනීමට අපනයනකරුවන් සඳහා සහාය ලබාදෙනු පිණිස, නිනිති තාක්ෂණ ආයතනය විසින්, අපනයන සංවර්ධන මණ්ඩලයේදී විද්‍යා සායනයක් ආරම්භ කරනු ලැබ ඇත. අපනයනකරුවන් වෙත උසස් විද්‍යා හා ඉංජිනේරු දැනුම ලබාදීම සඳහා, නිතිපතා රැස්වීම් පැවැත්වේ.

නිනිති තාක්ෂණ ආයතනයෙහි විද්‍යාගාර පහසුකම් සහ උසස් උපකරණ පරිහරණය සඳහා වයඹ, මොරටුව සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයන් සමඟ, මෙම වර්ෂය තුළදී අවබෝධතා ගිවිසුම් සඳහා අත්සන් තබන ලදි. 2016 වර්ෂයේදී නිනිති තාක්ෂණ ආයතනය විසින් ජාත්‍යන්තර මට්ටමේ එක්සත් ජනපද පේටන්ට් බලපත්‍ර හතරක් සඳහා අයදුම් කරන ලදි. මෙයට අමතරව, ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක් වූ ජර්නලයන්හි පත්‍රිකා 12 ක් ප්‍රකාශයට පත්කරන ලදි. 2016 වසරේදී, නිනිති තාක්ෂණ ආයතනය Forbes Asia සඟරාවේ සුවිශේෂී ඇගයීමට ලක් විණි.

මෙයට අමතරව පෞද්ගලික අංශයේ සේවාදායකයින් 20 කට අධික පිරිසක් සමඟ සාකච්ඡාවන්හි නිරත වූ අතර පර්යේෂණ තුනක් ආරම්භ කරන ලදි. ඇඟළුම් පර්යේෂණ අංශයේ සිදුකල සාර්ථක පර්යේෂණ හේතුවෙන් පේටන්ට් බලපත්‍ර සඳහා අයදුම් කරනු ලැබූ අතර වත්මන වන විට අලෙවි කිරීම සඳහා සාකච්ඡාවන් සිදුකෙරේ.

ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රය තුළ නිනිති තාක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කරනු පිණිස, මෙම වසර තුළදී නිනිති තාක්ෂණ සහතිකකරණ පාඨමාලා දෙකක් පවත්වන ලදි. (63 දෙනෙකුගේ සහභාගීත්වයෙන්)

2016 වර්ෂයේදී, පාසල් සිසුන් සහ ගුරුවරු, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සහ කථිකාචාර්යවරුන්, රාජ්‍ය නිළධාරින්, කර්මාන්තකරුවන්, පෞද්ගලික අංශයේ නිළධාරින් සහ විදේශීය නියෝජිතයින් ඇතුළු 2000 කට අධික සංඛ්‍යාවක් නිනිති තාක්ෂණ ආයතනය වෙත චාරිකාවේ නියැළී ඇත.

3.6 2016 වසරේ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

යෝජනා අංක	යෝජනා	අයවැය දේශනය හරහා යෝජිත මුදල (රු.මි.)	නිදහස් කරන ලද (රු.මි.)	භාවිත යට ගත් (රු.මි.)	ප්‍රගතිය
361	දියවැඩියාව, ඩෙංගු, නිදන්ගත වකුගඩු රෝගය සහ පිළිකා පිළිබඳ පර්යේෂණ සඳහා අධාර සහ සහාය ලබාදීම	250	50	50	• අංගසම්පූර්ණ සංකල්ප පත්‍රිකාවක් සකස් කිරීම • ප්‍රමුඛතාවය ලබාදුන් ව්‍යාපෘති සඳහා පළමු වාරිකය ලබාදීම • පර්යේෂණ විද්‍යාර්ථීන් සහ පර්යේෂණ විද්‍යාඥයින් සඳහා මාසික දීමනා ගෙවීම
371	ජාතික නවෝත්පාදන වැඩසටහන්, ජාතික තේමාගත පර්යේෂණ වැඩසටහන් සහ තාක්ෂණ සහගයෝගීතා යෝජනාක්‍රමයන් ඒකාබද්ධ කරමින් නවෝත්පාදන කඩිනම් කිරීමේ වේදිකාවක් ස්ථාපනය සඳහා නවෝත්පාදන කඩිනම් කිරීමේ අරමුදලක් සඳහා මූලික ප්‍රාග්ධනය	100	-	-	• ශ්‍රී ලංකාවේ නවෝත්පාදන බීජෞෂණාගාර සහ ඒ ආශ්‍රිත පද්ධති පිළිබඳ සමීක්ෂණයක් සම්පූර්ණ කරනු ලැබ ඇති අතර සමීක්ෂණ ලේඛනය සකසා ඇත. • අරමුදල භාවිතයට ගැනීම පිළිබඳ මාර්ගෝපදේශ කෙටුම්පත් කරන ලද අතර සාකච්ඡාවන් සිදු කෙරෙමින් පවතී

528	වැදගත් නිෂ්පාදනයන්හි තත්ත්වය සහතික කරනු පිණිස, තාක්ෂණික කාර්ය මණ්ඩලය වැඩිකිරීම සහ විද්‍යාගාර පහසුකම් වැඩි දියුණු කිරීම හරහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, කාර්මික තාක්ෂණ ආයතනය සහ ඖෂධ පර්යේෂණ විද්‍යාගාරය සවිමත් කිරීම	200	50 ITI	8.631	• විද්‍යාගාරය සඳහා Ultra High Performance Liquid Chromatography (UHPLC) යන්ත්‍රය මිලදී ගන්නා ලදි.
			SLSI	3.157	• විද්‍යාගාර සඳහා ජෛව විද්‍යාත්මක ආරක්ෂිත කැබිනෙට්ටුවක් මිලදී ගන්නා ලදි. • Single window system සඳහා desktop පරිගණක 20 ක් මිලදී ගැනීම

3.7 විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම

2016 වසරේදී, විගණන සහ කළමනාකරණ කමිටුව සිව්වරක් හමුවිය. විගණන කමිටුව විසින් භාණ්ඩාගාර නියෝජිත, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරී සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයන්හි ජ්‍යෝෂ්ඨ නිළධාරීන් හට මෙම රැස්වීම සඳහා ඇරයුම් කරන ලදි. සමාලෝචනයට ලක් වූ මූල්‍ය වර්ෂය තුළ විගණන කමිටුව විසින් වෙනත් කාර්යයන්ට අමතරව පහත ක්‍රියාකරකම්හි නිරත විණි.

- පාර්ලිමේන්තුව වෙත වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම
- අමාත්‍යාංශය සහ ආයතනය සඳහා වන අභ්‍යන්තර විගණන වාර්තා සහ බාහිර විගණන වාර්තා (විගණකාධිපති වාර්තා) සමාලෝචනය කිරීම
- භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් සිදුකරනු ලැබූ නිර්දේශයන් ක්‍රියාත්මක කරනු ලබන ආකාරය සමාලෝචනය කිරීම
- ප්‍රසම්පාදන සැලැස්ම, බැංකු සැසඳුම් යනාදිය ඉදිරිපත් කිරීම

4. 2016 වර්ෂයේ මූල්‍යමය ජයග්‍රහණ

4.1. අමාත්‍යාශයේ සහ ආයතනයන්හි මූල්‍යමය ජයග්‍රහණයන්හි සාරාංශය

විස්තරය	වෙන් කිරීම්		වියදම	
	පුනරාවර්තන (රු.මි.)	ප්‍රාග්ධන (රු.මි.)	පුනරාවර්තන (රු.මි.)	ප්‍රාග්ධන (රු.මි.)
අමාත්‍ය කාර්යාලය	47.863	17.000	47.304	5.273
පරිපාලන සහ ආයතන සේවා	170.517	8.700	162.796	7.351
විද්‍යා හා තාක්ෂණ සංවර්ධන වැඩසටහන්	463.129	956.338	452.783	488.344
ග්‍රහලෝකාගාරය	17.000	22.200	15.691	3.490
ආයතන	1013.000	1362.500	921.636	1189.585
එකතුව	**1711.509**	**2366.738**	**1600.210**	**1694.043**



4.2. අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම්

අමාත්‍යාංශය : විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
ශීර්ෂ අංකය : 196
කාණ්ඩය : පෞද්ගලික වේතන සහ වෙනත් පුනරාවර්තන

විස්තරය	වෙන් කිරීම් (රු.මි.)	මුළු වියදම (රු.මි.)	ඉතිරිය (රු.මි.)
අමාත්‍ය කාර්යාලය			
පෞද්ගලික වේතන	18.494	18.397	0.097
වෙනත් පුනරාවර්තන	29.369	28.907	0.462
එකතුව	**47.863**	**47.304**	**0.559**
පරිපාලන සහ ආයතන සේවා			
පෞද්ගලික වේතන	57.962	57.380	0.582
වෙනත් පුනරාවර්තන	112.555	105.416	7.139
එකතුව	**170.517**	**162.796**	**7.721**
විද්‍යා හා තාක්ෂණ සංවර්ධන වැඩසටහන්			
පෞද්ගලික වේතන	401.458	398.769	2.689
වෙනත් පුනරාවර්තන	61.671	54.014	7.657
එකතුව	**463.129**	**452.783**	**10.346**
ග්‍රහලෝකාගාරය			
පෞද්ගලික වේතන	7.630	7.527	0.103
වෙනත් පුනරාවර්තන	9.370	8.164	1.206
එකතුව	**17.000**	**15.691**	**1.309**
මුළු එකතුව	**698.509**	**678.574**	**19.935**

4.3. ආයතනයන්හි පුනරාවර්තන වියදම්

අමාත්‍යාංශය : විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
ශීර්ෂ අංකය : 196
කාණ්ඩය : පෞද්ගලික වේතන සහ වෙනත් පුනරාවර්තන

විස්තරය	වෙන් කිරීම් (රු.මි.)	මුළු වියදම (රු.මි.)	ඉතිරිය (රු.මි.)
රාජ්‍ය ආයතන			
නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය	112.000	92.878	19.122
ජාතික මූලික අධ්‍යයන ආයතනය	186.900	181.000	5.900
කාර්මික තාක්ෂණ ආයතනය	233.000	233.000	0
ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය	252.100	214.795	37.304
ජාතික පර්යේෂණ සභාව	19.000	16.679	2.321
ජාතික විද්‍යා පදනම	136.000	113.249	22.751
ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම	25.000	23.557	1.443
ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය	17.000	15.701	1.299
ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසම	32.000	30.766	1.224
එකතුව	**1013.000**	**921.636**	**91.364**

4.4 අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම

4.4.1 අමාත්‍යාංශය: විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

ශීර්ෂ අංකය : 196
කාණ්ඩය : පුනරුත්ථාපන සහ අත්කරගැනීම්

විස්තරය	වෙන් කිරීම් (රු.මි.)	මුළු වියදම (රු.මි.)	ඉතිරිය (රු.මි.)
අමාත්‍ය කාර්යාලය			
පුනුරුත්තාපන	5.000	2.626	2.374
අත්කරගැනීම්	12.000	2.647	9.353
එකතුව	**17.000**	**5.273**	**11.727**
පරිපාලන හා ආයතන සේවා			
පුනුරුත්තාපන	2.700	1.641	1.059
අත්කරගැනීම්	4.000	3.782	0.218
ශක්‍යතා ගොඩනැංවීම	2.000	1.928	0.072
එකතුව	**8.700**	**7.351**	**1.349**
මුළු එකතුව	**25.700**	**12.624**	**13.076**

4.4.2. අමාත්‍යාංශය: විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

ශීර්ෂ අංක : 196

කාණ්ඩය : පුනරුත්ථාපන සහ අත්කරගැනීම්

විස්තරය	වෙන් කිරීම් (රු.මි.)	මුළු වියදම (රු.මි.)	ඉතිරිය (රු.මි.)
විද්‍යා හා තාක්ෂණ සංවර්ධන වැඩසටහන			
1.විද්‍යාතා වැඩසටහන්			
පුනුරුත්තාපන	9.150	8.305	0.845
අත්කරගැනීම්	32.150	31.083	1.067
දැනුම පවරාදීමේ වැඩසටහන්	30.000	23.718	6.282
එකතුව	**71.300**	**63.106**	**8.194**
2.විද්‍යාත්මක සංවර්ධන වැඩසටහන්			
විද්‍යා හා තාක්ෂණ ප්‍රචලිත කිරීමේ වැඩසටහන	4.900	3.739	1.161
විද්‍යාත්මක පුහුණුව	6.000	5.589	0.411
වෙනත් රටවල් සමඟ විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාවයන්	45.100	43.865	1.235
විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාවයන්	2.030	2.022	0.008
විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය (COSTI)	2.008	1.290	0.718
එකතුව	**60.038**	**56.505**	**3.533**
3. නිනිති තාක්ෂණය			
ආයෝජනයන්	544.000	303.154	240.846
එකතුව	**544.000**	**303.154**	**240.846**
4. තාක්ෂණ ව්‍යවසායකත්ව සංවර්ධනය			
ආයෝජනයන්	2.000	0.790	1.210
එකතුව	**2.000**	**0.790**	**1.210**
5. පර්යේෂණ හා සංවර්ධන ආයෝජන රාමුව ක්‍රියාත්මක කිරීම			
ආයෝජනයන්	4.000	3.000	1.000
එකතුව	**4.000**	**3.000**	**1.000**
6. දියවැඩියාව, ඩෙංගු, නිදන්ගත වකුගඩු රෝගය සහ පිළිකා පිළිබඳ පර්යේෂන සඳහා සහාය ලබාදීම			
ආයෝජනයන්	50.000	50.000	0
එකතුව	**50.000**	**50.000**	**0**
7. පිරියත, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ (SLSI& ITI)			
ආයෝජනයන්	50.000	11.789	38.211
එකතුව	**50.000**	**11.789**	**38.211**
8.ජාතික විද්‍යා මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම			
ආයෝජනයන්	175.000	0	175.000
එකතුව	**175.000**	**0**	**175.000**
9. ග්‍රහලෝකාගාරය			
පුනුරුත්තාපන	11.000	0.699	10.301
අත්කරගැනීම්	11.000	2.721	8.279
4D ඩිජිටල් ප්‍රක්ෂේපන යන්ත්‍රයක් ස්ථාපනය කිරීම	0	0	0
ශකායතා ගොඩනැංවීම	0.200	0.070	0.130
එකතුව	**22.200**	**3.490**	**18.710**
මුළු එකතුව	**1004.238**	**504.458**	**499.780**

4.4.3 ආයතනයන්හි ප්‍රාග්ධන වියදම්

අමාත්‍යාංශය: විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
ශීර්ෂ අංකය : 196
කාණ්ඩය : පුනරුත්ථාපන සහ අත්කරගැනීම් සහ වෙනත් ප්‍රාග්ධන වියදම්

විස්තරය	වෙන් කිරීම් (රු.මි.)	මුළු වියදම (රු.මි.)	ඉතිරිය (රු.මි.)
රාජ්‍ය ආයතන			
නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය (ACCIMT)	80.000	79.043	0.957
ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS)	145.300	144.999	0.300
කාර්මික තාක්ෂණ ආයතනය (ITI)	531.000	388.531	142.469
ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERDC)	50.000	47.345	2.655
ජාතික පර්යේෂණ සභාව (NRC)	230.000	230.000	0
ජාතික විද්‍යා පදනම (NSF)	250.000	231.815	18.185
ජාතික විද්‍යා හා තාක්ෂණික කොමිසම (NASTEC)	11.000	8.603	2.397
අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB)	5.200	2.000	3.200
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම (SLIC)	60.000	57.249	2.751
මුළු එකතුව	**1362.5**	**1189.585**	**172.914**



4.5. අත්තිකාරම් ගිණුම

රජයේ කාර්යයන් සඳහා වියදම්හි උපරිම සීමාවන් (ශ්‍රී.ලං.රු.)	රජයේ කාර්යයන් සඳහා ලැබීම්හි අවම සීමාවන් (ශ්‍රී.ලං.රු.)	රජයේ කාර්යයන්හි හර ඉතිරිය සඳහා උපරිම සීමාවන් (ශ්‍රී.ලං.රු.)
25,000,000.00	10,000,000.00	75,000,000.00

3 වන මහල, සෙත්සිරිපාය, 1 වන අදියර, බත්තරමුල්ල

3rd Floor, Sethsiripaya, 1st Stage, Battaramulla

3 வது மாடி, செத்சிரிபாய, முதலாம் பிரிவு, பத்தரமுல்லை